**කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව**

**නීති පීඨය**

**නීතිවේදී උපාධි පරීක්ෂණය (මාර්ගගත), පළමු වසර (පුනරීක්ෂණ) - 2020**

# ශ්‍රී ලංකාවේ නීති පද්ධති

(පැ තුනයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව: හයයි (06)

ප්‍රශ්න පත්‍රයේ ඇති පිටු සංඛ්‍යාව: හතරයි (04)

ඕනෑම ප්‍රශ්න **<u>තුනකට (03) පමණක්</u>** පිළිතුරු සපයන්න.

(අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.)

---

1. අඛණ්ඩ තීරණ මාලාවකින් හැරුණු කොට රෝම-ලන්දේසි නීතියේ මූලික මූලධර්ම වෙනස්කළ නොහැකි බව *සමීඩ් එ. සේගුතම්බි* නඩුවේදී අධිකරණය ප්‍රකාශ කරන ලදි.

   ශ්‍රී ලංකාවේ රෝම-ලන්දේසි නීතියේ විෂය පථය හා අදාළත්වය ඇසුරින් ඉහත සඳහන් අධිකරණමය ආකල්පය සාකච්ඡා කරන්න. නඩු තීන්දු හා අදාළ නීති ප්‍රතිපාදන ඇත්නම් ඒවා ඉදිරිපත් කරමින් ඔබේ පිළිතුර සනාථ කරන්න.

2. *''ව්‍යවස්ථා මඟින් අන්තර්ගතකර තිබූ ඒවා හැරුණු කොට ඉංග්‍රීසි මූලධර්ම අධිකරණ තීන්දුවල සඳහන් කර ඒවා සකස්කරගත් අවස්ථා බොහෝමයක් ශ්‍රී ලංකාවේ නීති වාර්තාවල අඩංගු වේ. මෙම තාක්ෂණික වශයෙන් අනිසි ලෙස භාවිත කරන ලද අධිකරණ තාක්ෂණය මඟින් ඉංග්‍රීසි නීතිය ලන්දේසි නීතිය සුරැකීම පිණිස අනවසරයෙන් ඇතුළු විය. නමුත් මෙකී ක්‍රියාවලිය මඟින් නිෂ්පාදනය කරන ලද ඉංග්‍රීසි නීතිය සහ රෝම-ලන්දේසි නීතියෙහි සංකලනය, නීති පද්ධතිය නිසැකවම පොහොසත් කළේය.''*

   -එල්.ජේ.එම්. කුරේ, ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය පිළිබඳ හැඳින්වීමක්, දෙවන (සංශෝධිත) සංස්කරණය 1992, 37 පිටුව

   ඔබ එකඟ වන්නෙහිද? අධිකරණමය අධික්‍රියාකාරිත්වය හරහා ශ්‍රී ලංකාවේ නීති පද්ධතියට ඉංග්‍රීසි නීතිය පිළිගැනීම පිළිබඳව අවධානය යොමුකරමින් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුර උචිත නඩු තීන්දු අධිකාරීන් සහය කරගනිමින් සනාථ කළ යුතුය.

3. (අ) සහ (ආ) යන **දෙකටම** පිළිතුරු සපයන්න.

අ). 'උඩරට නීතිය සාමාන්‍යයෙන් සළකනු ලැබුවේ උඩරට පළාත්වල පදිංචිව සිටි සිංහල ප්‍රජාවගෙන් කොටසකට අදාළවන්නා වූ පුද්ගල නීතියක් ලෙසය.'

ඉහත ප්‍රකාශය ඇසුරින්, බ්‍රිතාන්‍ය යුගයේ සහ පශ්චාත් යටත්විජිත යුගයේ ස්ථාපිත කරන ලද අදාළ ව්‍යවස්ථාපිත නීතිය හා නඩු තීන්දු නීතියේ අදාළත්වය සාකච්ඡා කරන්න.

(මුළු ලකුණු සංඛ්‍යාවෙන් ලකුණු 40)

ආ). බිනාරි ඇහැලේපොළ මහනුවර ඇහැලේපොළ පරම්පාරවේ එකම ජීවත්වන උරුමකාරිය වේ. ඇය කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ උපාධි අපේක්ෂිකාවකි. බිනාරි කොළඹ වෙසෙන බුද්ධික පීරිස් සමඟ ප්‍රේම සම්බන්ධතාවක් ඇතිකර ගනී. ඔහුද ඇය සමඟ එකම කණ්ඩායමේ ඉගෙනුම ලබයි. වර්තමාන වසංගත තත්වය හේතුවෙන් බිනාරි හට අධ්‍යාපන කටයුතු සඳහා මහනුවර සිට කොළඹ බලා යාම සීමා කිරීමට සිදු වූ අතර ඇය මහනුවර පිහිටි ඇයගේ නිවසේදී මාර්ගගතව අධ්‍යාපනය හැදෑරීමට නියමිතව තිබුණි. බිනාරි සහ බුද්ධික අවසාන විභාගයෙන් පසුව විවාහවීමට තීරණය කළ අතර දෙදෙනාම විවාහයෙන් පසුව කොළඹ ජීවත්වීමට සැලසුම් කළහ. කෙසේවෙතත්, බුද්ධික උඩරැටියෙකු නොවන බැවින් බිනාරිගේ දෙමව්පියන් ඔවුන්ගේ තීරණවලට විරුද්ධ විය.

උඩරට නීතිය යටතේ ඔවුනට වලංගු විවාහයකට එළඹිය හැකිද යන්න පිළිබඳව උපදෙස් දෙන්න.

ඔබේ නීතිමය අදහස ලියා දක්වන්න. ඔබේ පිළිතුර අදාළ නෛතික අධිකාරීන් යොදාගනිමින් සනාථ කරන්න.

(මුළු ලකුණු සංඛ්‍යාවෙන් ලකුණු 60)

4. (අ) සහ (ආ) යන **දෙකටම** පිළිතුරු සපයන්න.

අ). "ශ්‍රී ලංකාවේ අදාළවන මුස්ලිම් නීතියෙහි දේශීය මුස්ලිම්වරුන්ට ආවේණික වූ පරිචයන් හා චාරිත්‍ර ඇතුළත්වන අතර ඒවා ඉස්ලාමීය නීති විද්‍යාවේ කොටසක් නොවේ."

ඉහත යෝජනාව සමඟ ඔබ එකඟ වන්නෙහිද? විනිශ්චිත නඩු තීරණ උපුටා දක්වමින් ඔබේ පිළිතුර සනාථ කරන්න.

(මුළු ලකුණු සංඛ්‍යාවෙන් ලකුණු 50)

ආ). රේමන් කොළඹ ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරිකයෙකු වන අතර 2010දී මනහුවර සිටි සෝනියා සමඟ විවාහ විය. ඔහුගේ ව්‍යාපාරික කටයුතු හේතුවෙන් බොහෝ දිනවල ඔහු කොළඹ රැඳී සිටින අතර සති අන්තයේ පමණක් සෝනියා බැලීමට පැමිණෙයි. මේ අතර, ඔහු සිය පෞද්ගලික ලේකම්වරිය වන සකුරා සමඟ විවාහවීමට කැමැත්තෙන් සිටී. රේමන් හා සකුරා යන දෙදෙනාම ඉස්ලාම් ආගම වැළඳගැනීමට හා ඔවුන්ගේ විවාහය මුස්ලිම් නීතිය යටතේ ලියාපදිංචිකිරීමට අපේක්ෂා කරති. නිසි උසාවියකින් දික්කසාද නියෝගයක් නොමැතිව

රේමන්ට වෙනත් විවාහයක් සිදුකරගත නොහැකි බව පවසමින් සෝනියා ඔවුන්ගේ විවාහය අභියෝගයට ලක් කරයි.

මුස්ලිම් නීති ප්‍රතිපාදන යටතේ වලංගු විවාහයකට එළඹීමට ඔහුට හැකිදැයි රේමන් හට උපදෙස් ලබාදෙන්න.

(මුළු ලකුණු සංඛ්‍යාවෙන් ලකුණු 50)

5. රවී පේදුරුතුඩුවේදී ඉපදුන අතර එය ඔහුගේ පවුල පරම්පරා ගණනාවක් ජීවත්වූ ප්‍රදේශය වේ. උසස් අධ්‍යාපනය ලැබීමෙන් පසු රවී සහ ඔහුගේ යහළුවකු වන කමල් සමඟ තමන්ගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට තීරණය කළ අතර, ඒ සඳහා දෙදෙනාම එක්ව යාපනය නගරයෙන් ගොඩනැගිල්ලක් මිලදීගෙන එම ඉඩමෙහි හවුල්කරුවන් බවට පත්විය. එම ඉඩමේ ගොඩනැගිල්ල ඉදිකිරීමට පෙර රවීට කොළඹ පිහිටි කීර්තිමත් සමාගමකින් රැකියා අවස්ථාවක් හිමිවිය. රවී රැකියාව සඳහා කොළඹට මාරුවූ අතර කොළඹදී හින්දු ජාතික තරුණියක් සමඟ විවාහවී ඔහුගේ බිරිඳගේ දෙමාපියන් සමඟ පදිංචි විය. දැන් රවීහට ඕස්ට්‍රේලියාවේ පිහිටි බහු ජාතික සමාගමකින් ඉහළ වැටුපක් සහිත රැකියා අවස්ථාවක් ලැබී ඇත. එබැවින්, ඔහු එම රැකියාවට ඇතුළත්වීම සඳහා තම බිරිඳ සමඟ ඕස්ට්‍රේලියාවට යාමට තීරණය කර ඇත. ශ්‍රී ලංකාවෙන් පිටත්වීමට පෙරාතුව රවී තම හවුල් ඉඩමේ තමාගේ කොටස විකිණීමට බලාපොරොත්තුවන අතර එය වෙළඳපොළ වටිනාකම මත කමල් විසින් මිලදීගැනීමට සූදානම්ව සිටියද එය රවීගේ තවත් මිතුරෙකුට විකිණීමට අවශ්‍ය පියවර ගෙන තිබේ.

I. රවී ශ්‍රී ලංකාවෙන් පිටවයාමට පෙර ඔහුට තේසවලාමෙයි නීතිය අඛණ්ඩව ක්‍රියාත්මක වන්නේදැයි දැනගැනීමට බලාපොරොත්තු වේ. ඔහුට උපදෙස් ලබා දෙන්න.

(මුළු ලකුණු සංඛ්‍යාවෙන් ලකුණු 60)

II. එම ඉඩමේ හවුල් හිමිකරු වශයෙන් රවීගේ කොටස මිලදීගැනීමට තමාට ඇති අයිතිය පිළිබඳව දැනගැනීමට කමල් බලාපොරොත්තු වේ. ඔහුට උපදෙස් ලබා දෙන්න.

(මුළු ලකුණු සංඛ්‍යාවෙන් ලකුණු 40)

ඔබේ පිළිතුර අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා විනිශ්චිත නඩු තීරණ මඟින් සනාථ කළ යුතුය.

6. පහත සඳහන් සිදුවීම් සඳහා අධිකරණ බලය ඇති අධිකරණය හඳුනාගනිමින් අධිකරණ අභියාචනා ක්‍රියාවලින්හි අධිකරණ බලය පැහැදිලි කරන්න:

අ). නිමල් විසින් තම අසල්වැසියා වන රුමාල් සමඟ ඉඩම් ආරවුලක් ඇතිකරගෙන ඇති අතර දෙදෙනාම අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කර ඇත;

ආ). ශර්මි විසින් සිය සැමියාට එරෙහිව නඩත්තු නඩුවක් සහ ද්වේශසහගත අතහැරයාම පදනම්කරගනිමින් තවත් නඩුවක් පැවරීමට බලාපොරොත්තු වේ;

ඇ). ෆාතිමා තම සැමියා වන රහුමාන්ගෙන් තම දියණිය සඳහා ළමා නඩත්තු නඩුවක් ගොනු කිරීමට කැමැත්තෙන් සිටී;

ඈ). අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශය විසින් රාජ්‍ය සේවා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා විශ්‍රාමිකයින්ගේ ප්‍රතිලාභ පිළිබඳ නිකුත් කළ නව චක්‍ර ලේඛයෙන් අධ්‍යාපන සේවයේ

විශ්‍රාමිකයින් බැහැර කර නැති බව ප්‍රනාන්දු මහතා පවසයි. ඔහු එම නව චක්‍ර ලේඛය මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමේ පදනම මත අභියෝගයට ලක්කිරීමට කැමැත්තෙන් සිටී;

ඉ). මැණිකේ විසින් චෝදනා කර සිටිනුයේ මෞලිස් එන්ටටේන්මන්ට් සමාගම විසින් ඇයගේ එක් සංගීත ඇල්බමයක් සාවද්‍යාව පිටපත් කර ඇති බවයි. ප්‍රකාශන අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් නඩු පැවරීමට ඇය කැමැත්තෙන් සිටී.

(ලකුණු 20 X 5)

********************